# 9 ශ්‍රේණිය සිංහල

## 07 ඒකකය - 2022

# දෑසේ නිල් පැහැය



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

09 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 07. දෑසේ නිල් පැහැය

කවිය යනු මිනිසාගේ ජීවිතාවබෝධය පුළුල් කරන සාහිත්‍යාංගයකි. කවි රස විඳීම හා නිර්මාණය කිරීම සඳහා සහජයෙන් ලද හැකියාව, පොත් පත් පරිශීලනයෙන් ලද අවබෝධය, නිරන්තර අභ්‍යාසය අවශ්‍ය බව පුරාණ කාව්‍ය විචාරයේ දී පෙන්වා දී ඇත. විවිධ කාව්‍ය නිර්මාණ රස විඳීමෙන් අපගේ ජීවිතාවබෝධය පුළුල් වන අතර, කාව්‍ය නිර්මාණය සඳහා මග පෙන්වීමක් ද එමගින් ලබා ගත හැකි ය.



මේ පාඩමේ ඇතුළත් වන්නේ දයාසේන ගුණසිංහ කවියාගේ නිර්මාණයකි. එය 1974 රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලද 'රන් තැටියක කඳුළු' කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගෙන ඇත. කවියකු, කෙටිකතාකරුවකු, පුවත්පත් කලාවේදියකු වන දයාසේන ගුණසිංහ පරිවර්තකයෙක් ද වෙයි.

**අවබෝධය**

කවි පෙළ ඇසුරෙන් පිළිතුරු ලියන්න.

1. දෑසේ නිල් පැහැය නැති වීමට කවියා දක්වා ඇති හේතු තුනක් කෙටියෙන් ලියන්න.
2. දෑසේ නිල් පැහැය කවියා උපමා කර ඇත්තේ මොනවාට ද?
3. බොහෝ වෙහෙස වී ඉතා අඩු මුදලක් උපයන බව දැක්වීමට කවියා යොදා ගෙන ඇති කවි පද දෙක උපුටා දක්වන්න.
4. කවි පෙළෙහි ව්‍යංග්‍යාර්ථ ඉස්මතු කර දක්වන්න.
5. කවි පෙළ පිළිබඳ කෙටි රසාස්වාදයක යෙදෙන්න.

## අවබෝධය

1. ස්වාමියා වෙනුවෙන් බත් ඉදෙන්නට ළිපට පිඹ මොළවන විටත්, රැයට මුහුණ ලා ඉඳගෙන ස්වාමියා එන තුරු මග බලමින් දිවි ගණනක් ගෙවනා විටත්, ස්වාමියා නිදි පැදුරේ නඟන සුසුම් කෙඳිරිලි හඬ නිසා හදවතේ ඇති වන වේදනාව නිසාත් දෑසේ නිල් පැහැය නැති වී යයි.

2. නිල් පැහැ ඉන්ද්‍රනීල මාණික්‍යක නිල් පැහැයට (නිල් ඉඳුවර නිලේ අරුම)
ජලයේ තිබෙන නිල් පැහැයට (ඈත දියඹ නිලේ වරුණ)

3. බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම

4. ==දෑසේ නිල් පැහැය දැවී සෙමෙන් තුරන් විය නොදැනිම== - තමාටත් නොදැනුවත්වම තාරුණ්‍ය තමාගෙන් පළාගිය අන්දම මින් ව්‍යංග්‍යාර්ථවත් කරයි.
==බත් දෙකටක් උපයන්නට අටු කොටු පුරවා දවසෙම== - බොහෝ වෙහෙස වී ඉතා අඩු මුදලක් උපයන බව මින් ව්‍යංග්‍යාර්ථවත් කරයි.

5. දයාසේන ගුණසිංහයන්ගේ මෙම කාව්‍ය නිර්මාණයට තේමා වී ඇත්තේ සිය යොවුන් විය ජීවිත කම්කටොලු මැද්දේ පළාගිය බිරියක්, තම දුවගේ අනාගතය පිළිබඳ බලාපොරොත්තු දෙස බලා කටයුතු කිරීමට තම ස්වාමියාට කරන ආයාචනයකි.

ජීවන බර උසුලන්නෝ එම බර නිසා ම අකාලයේ මහලු වියට පත් වෙති. ජීවන බරම ඔවුහු සතුටක් කර ගනිති. කවියා පළමු කවෙන්,

"ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දීගෙන
පිඹ මොළවන විට ළිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්න
දෑසේ නිල් පැහැය දැවී
සෙමෙන් තුරන් විය නොදැනිම."

යනුවෙන් ව්‍යංගාර්ථවත් කරන්නේ එය බව පෙනේ. තමාටත් නොදැනුවත්ව ම තාරුණ්‍ය, තමාගෙන් පළාගිය අන්දම ඇය ප්‍රකාශ කරන්නේ කිසිම ද්වේශයකින් හෝ පසුතැවිල්ලකින් තොරවය. ඒ තමන්ට උරුම වූ ජීවිතය එය බැවිනි.

"බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම
මඳ සැනසිල්ලක් ලබමින්
නිදි පැදුරේ වැතිරෙන ඔබ
නඟන සුසුම් කෙඳිරිලි හඬ
හද මිරිකා හළ කඳුළට
දෑසේ නිල් පැහැ සේදී
ගලා නිමා විය නොදැනිම."

බත් වේලක් උදෙසා අනුන්ට දවස පුරා මෙහෙ කොට නිදි පැදුරට වී තම ස්වාමියා කෙළිරි ගානා විට ඈ තුළ හටගන්නා සොවින් ගලන කඳුලින් 'දෑසේ නිල් පැහැය නොදැනීම ගලා නිමා විය' යන වාච්‍යාර්ථය තෙවන කවියෙන් වාච්‍යාර්ථය ඉක්මවා ව්‍යංගයක් බවට කවියා පත් කර ඇති අයුරු අපූරු ය. කවියාගේ ප්‍රතිභාවට එය කදිම නිදසුනකි. ඒ මගින් පාඨකයා තුළ රසෝත්පාදනය වේ.

'හද මිරිකා හළ කඳුළට දෑසේ නිල් පැහැ සේදී, ගලා නිමා විය නොදැනිම' යන්න කෙතරම් රසවත් අරුත්බර යෙදුමක් ද?

"අතීතයක් ගැන සිතමින්
මගේ දෑස දෙස නොබලා
අනාගතය දෙස යොමු වූ
දුවගෙ දෑස දෙස බලන්න."

අතීතය ගැන ලතවීමෙන් පලක් නැත. අනාගතයේදී තම දියණියට මෙවන් දුක්ඛිත ජීවිතයට මුහුණ දීමට සිදු නොවන පරිදි කටයුතු කිරීමට සැලැස්විය යුතු ය. එය ඇයගේ උදාර ප්‍රාර්ථනයයි.

# විශේෂණ පද

- නාම පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යොදන පද, නාම විශේෂණ පද වේ.
  - ✓ සුවඳ මල
  - ✓ නිල් අහස
  - ✓ විශාල ගස
  - ✓ හොඳ මිනිසා
- ක්‍රියා පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යොදන පද, ක්‍රියා විශේෂණ පද වේ.
  - ✓ වේගයෙන් දුවයි.
  - ✓ බියෙන් වෙවුලයි.
  - ✓ හෙමින් ගමන් කරයි.
  - ✓ ලුහුඬින් පවසයි
- උදා:- 'දෑසේ නිල් පැහැය දැවී සෙමෙන් තුරන් විය...'
  - ✓ එහි 'පැහැය' යන නාම පදයේ විශේෂ ගුණයක් දැක්වීම සඳහා 'නිල්' යන පදය යෙදී ඇත. ඒ අනුව 'නිල්' යනු මෙහි දී නාම විශේෂණ පදයකි.

    එහි 'තුරන් විය' යන ක්‍රියා පදයේ විශේෂ ගුණයක් දැක්වීම සඳහා 'සෙමෙන්' යන පදය යෙදී ඇත. ඒ අනුව 'සෙමෙන්' යන්න මෙහි දී ක්‍රියා විශේෂණයක් ලෙස හඳුනා ගත හැකි ය.

**ලිඛිත අභ්‍යාස**

1. පහත යෙදුම්වල ඇතුළත් නාම විශේෂණ පද උපුටා දක්වන්න.

   i. සිනා හඬ -
   ii. දෙව් බොජුන් -
   iii. නිදි පැදුර -
   iv. ඈත දියඹ -
   v. යොවුන් විය -

# ලිඛිත අභ්‍යාස

**1.**

I. සිනා හඬ - සිනා
II. දෙව් බොජුන් - දෙව්
III. නිදි පැදුර - නිදි
IV. ඈත දියඹ - ඈත
V. යොවුන් විය - යොවුන්

2. ඉහත 1 ප්‍රශ්නයේ දැක්වූ නාම පදවලට වෙනත් විශේෂණ පදය බැගින් යොදා නැවත ලියන්න.

   උදාහරණ: නිල් පැහැය
   රතු පැහැය

**2.**

I. සිනා හඬ - මිහිරි හඬ
II. දෙව් බොජුන් - රස බොජුන්
III. නිදි පැදුර - පන් පැදුර
IV. ඈත දියඹ - මෑත දියඹ
V. යොවුන් විය - මහලු විය

3. පහත වාක්‍යවල ඇතුළත් ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.

i. දරුවා බියෙන් අඬයි.
ii. සුළඟ වේගයෙන් හමයි.
iii. ඔහු පරෙස්සමෙන් රිය පදවයි.
iv. ළමයා සතුටින් සෙල්ලම් කරයි.
v. ඇය හොඳින් ඉගෙන ගනියි.

4. ඉහත ක්‍රියාකාරකමෙන් උපුටා ගත් ක්‍රියා විශේෂණ පද භාවිත කරමින් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

3.
I. බියෙන්
II. වේගයෙන්
III. පරෙස්සමෙන්
IV. සතුටින්
V. හොඳින්

4.
I. ළමයා බියෙන් කෑගසයි.
II. ඔහු වේගයෙන් රිය පදවයි.
III. සෙබළා පරෙස්සමෙන් යුධ පිටිය දෙසට පා තබයි.
IV. ඇය සතුටින් ගීතයක් ගැයුවා ය.
V. මල්ලී හොඳින් ඉගෙන ගනියි.

5. පහත දැක්වෙන නාම හා ක්‍රියා පදවලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩ නගන්න.

| | | |
|---|---|---|
| i. ධාවකයා | - | දුවයි |
| ii. සිසුවා | - | සමත් වෙයි |
| iii. නිවේදිකාව | - | ප්‍රකාශ කරයි |
| iv. ගස | - | සෙලවෙයි |
| v. නැට්ටුවා | - | නටයි |

**5.**

I. ශක්තිමත් ධාවකයා වේගයෙන් දුවයි.
II. දක්ෂ සිසුවා විභාගය ඉහළින් සමත් වෙයි.
III. තරුණ නිවේදිකාව සතුටින් ප්‍රකාශ කරයි.
IV. විශාල ගස රිද්මයකට සෙලවෙයි.
V. උඩරට නැට්ටුවා තාලයකට නටයි.

6. පහත ඡේදයේ සඳහන් නාම විශේෂණ පද තෝරා ලියන්න.

සෙල්ලම් පිටියක සාදන ලද මඩුවක් සේ කැලෑ රොද අපට බෙහෙවින් ප්‍රයෝජන විය. වහින විට අප, අපගේ හිස් සෙවණ කර ගැනීමට දුවන්නේ මේ කැලෑ රොද තුළට ය. මැස්සක් මෙන් සැදුණු පඳුරු මුදුන් නිසා, කැලෑ රොද ඇතුළත බිම වහල් තලයකින් සෙවණ වුණු මඩුවක් වැන්න. ඝනව වැඩුණු අතු ඉති සහිත පඳුරු මුදුන් කිහිපයකින් සෙවණ වුණු ඇතැම් තැනක්, මහ වැස්සක දී වුව ද අප ආරක්ෂා කරයි. සෙනසුරාදාත්, ඉරිදාත් අප උදේ සිට සවස් වන තෙක් සෙල්ලම් කරන්නේ මේ කැලෑ රොද ඉදිරියෙහි වන වැලි තලාවෙහි ය.

(මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ)

**6.**

- ✓ සෙල්ලම්
- ✓ කැලෑ
- ✓ පඳුරු
- ✓ වහල්
- ✓ ඝනව වැඩුණු
- ✓ මහ
- ✓ වැලි

# කවියක රස විඳ නව කවි පබඳිමු

නැණ නැවින් සත් සයුරු තරණය කරන කවියනි, මගේ දැය සතු
පණ පොවා අදහසට පදයට ලොවක් පෙරළන තරමෙ බලගතු
රණ විකුම් දක්වමින් යුද පෙරමුණට ජාතිය යැවිය හැකි මතු
ජන සිතුම්, ජන පැතුම්, ජන වේදනා ඔස්සේ කවි ලිවිය යුතු

උපන් කරුමෙට දොළොස් මාසය ගෙවන සා ගින්දරට පෙම් බැඳ
දොරෙන් වහලෙන් හිරුගෙ සරදම් සිනා ගෙට එන පැලක පින් මඳ
අහිංසක දරු පවුලකට හිමි කුවෙර පාලන උරුමයෙන් ලද
දකින්නට දුක් නැතොත් කවි ඇස, අතට නොගනිව් ලියන පන්හිඳ

කිවි දසුන - පී. මලල්ගොඩ

- කවි නිර්මාණය සඳහා එබඳු විවිධ අද්දැකීම් පාදක කර ගත හැකි ය. තමා සැබවින් ම අත්විඳි සිදුවීමක්, පොත් පත්, පුවත්පත් ආදිය කියවීමෙන් ලත් අද්දැකීමක් හෝ වෙනත් අයකු කියනු ඇසූ සිදුවීමක් පදනම් කර ගෙන කාව්‍ය කෘති නිර්මාණය කළ හැකි ය. උදා:- වාල්මීකී විසින් රාමායණය රචනා කරන ලද්දේ මහා බ්‍රහ්මයා පැවසූ රාම කුමරුගේ ජීවිත කතාව පදනම් කර ගෙන ය.
- සියලු අද්දැකීම් ඇසුරෙන් කාව්‍ය නිර්මාණ බිහි වන්නේ නැත. අද්දැකීමක් ප්‍රතිනිර්මාණය කිරීමෙන්, රසවත් හා පෙර නුදුටු විරූ ආකාරයකින් එය නැවත ගොඩනැගීමෙන් කවි බිහි වෙයි.
- කථකයාට හෝ අවස්ථාවට ගැළපෙන බසක් යෙදීම, උපමා රූපක සහිත ව්‍යංග්‍යාර්ථවත් භාෂා භාවිතය ආදි විවිධ උපක්‍රම මඟින් කවිය රසවත් හා අර්ථවත් කර ගත හැකි ය.

# ගුරු අත් පොතෙන්

## ගුණාත්මක යෙදවුම්

✓ රන්තැටියක කඳුළු - දයාසේන ගුණසිංහ
✓ සාහිත්‍යය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
✓ සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
✓ කවි ශික්ෂාව - කුමාරතුංග මුනිදාස

## මූලික වදන් හා සංකල්ප

✓ මතුපිටින් කියැවෙන අර්ථයට වඩා වෙනස් අරුතක් ප්‍රකාශ වීම ව්‍යංග්‍යාර්ථ නම් වේ.
✓ නිර්මාණ රසවත් කර ගැනීම සඳහා යොදා ගන්නා උපක්‍රම කාව්‍යෝක්ති නම් වේ.
✓ නාම පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යෙදෙන පද නාම විශේෂණ නම් වේ.
✓ ක්‍රියා පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යෙදෙන පද ක්‍රියා විශේෂණ නම් වේ.

## ඇගයීම හා තක්සේරුකරණය

✓ විවිධ පද වර්ග අතර විශේෂණ පදවල ලක්ෂණ කියයි.
✓ විශේෂණ පද ප්‍රභේද හඳුනා ගෙන පැහැදිලි කරයි.
✓ විශේෂණ පද භාෂාව පෝෂණය සඳහා ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
✓ විශේෂණ පද භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

09 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 07 - දෑසේ නිල් පැහැය

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.

(1). ''දෑසේ නිල් පැහැය'' පද්‍ය පංතිය රචකයා කවුරුන්ද?

..............................................................................................................

(2). එය උපුටාගත් කාව්‍ය සංග්‍රහය නම් කරන්න.

..............................................................................................................

(3). කවි පෙළෙහි ව්‍යංග්‍යාර්ථය සහිත අවස්ථා කීපයක් ගෙනහැර දක්වන්න.

..............................................................................................................

..............................................................................................................

(4). මෙහි සඳහන් කාන්තාව තම පවුල් සංස්ථාව රැක ගැනීමට මහත් උත්සාහයක් දරණ තැනැත්තියකි. උදාහරණ තුනක් දක්වන්න.

..............................................................................................................

..............................................................................................................

(5). පහත පදවල අරුත් ලියන්න.

I. දෙව් බොජුන - ..............................................................................

II. දියඹ - ..............................................................................

III. උවම් - ..............................................................................

IV. නිල් ඉඳුවර - ..............................................................................

V. දිවි ගණනක් - ..............................................................................

02. පහත ගීත කොටස ඇසුරින් පිළිතුරු සපයන්න.

''නො අදහා බුදු කෙනකු දෙවියකු
මානයෙන් වල්මත්ව සිටි මම
ගලක් යැයි ඔබ සිතා සිටියෙමි
තෙතක් හෝ කිසි දයාවක් නැති
ගලින් කළ ඔබ හදින් වෑහෙන
මහා කරුණා ගුණය නො පෙනිණ''

(1). ඉහත සඳහන් ගීත ඛණ්ඩයෙහි කවියා තමා සතු වූ ගුණයක් පිළිබඳව සඳහන් කරයි. එය කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

(2). මෙය රචිත දෘෂ්ටිකෝණය කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

(3). මෙම ගීත කොටසින් විස්තර වන්නේ කුමක් පිළිබඳවද?

.............................................................................................................................................

.............................................................................................................................................

(4). 'ගලින් කළ' යන්නට යෙදිය හැකි තනි පදය ලියන්න.

.............................................................................................................................................

(5). මෙහි 'වල්මත්ව සිටියා' යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

03. පහත ඡේදයේ සඳහන් නාම විශේෂණ පද සහ ක්‍රියා විශේෂණ පද ඇතුළත් කොට වගුවක් සකසන්න.

රාත්‍රී අඳුර දැඩි වන විට නිහඬතාවය නිවස පුරා රජයන්නට විය. ඔහුගේ හදවත වේගයෙන් ස්පන්දනය වන්නට විය. තම ජීවිත කාලය තුළ අසන්නට ලැබුණු සියලුම යක්ෂයන් හා භූතයන් ඔහුගේ මතකයට නැගිණි. ඔහුගේ අඹ යාළුවා වූ මානි පාර කෙළවර ඇති නුග ගසේ වාසය කරන යක්ෂයාව නිතර නිතර දැක තිබේ. එමෙන්ම මුනිකම්ගේ පියා ගෙදර එද්දී ගඟ අද්දර රැක සිටි යකෙක් ඔහුගේ කම්මුල්වලට ගසා ඇත. මේ අන්දමින් ඔහුගේ සිතුවිලි ගලා යන්නට විය. ස්වාමි බියෙන් ක්ලාන්ත වූයේය. මහ පාරේ ලාම්පු කණුවේ ලාම්පුවේ ආලෝක ධාරාවෙන් බිත්තියේ සෙවණැලි වැටිණි. දැඩි නිහඬතාවය මැදින් ඔහුට බොහෝ ශබ්ද ඇසිණ. ඔරලෝසුවේ බට්ටාගේ නාදය ගහකොළ සෙලවෙන හඬ රාත්‍රී කෘමීන්ගේ නාදය ඒ අතර විය.

| නාම විශේෂණ පද | ක්‍රියා විශේෂණ පද |
|---|---|
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |

*සැකසුම: එස්.ඒ. ප්‍රියංගනී මිය*

# පිළිතුරු



**Answer**

## I කොටස

1.

I. දයාසේන ගුණසිංහ කවියා

II. 'රන් තැටියක කඳුළු' කාව්‍ය සංග්‍රහය

III. දෑසේ නිල් පැහැය දැවී සෙමෙන් තුරන් විය නොදැනිම - තමාටත් නොදැනුවත්වම තාරුණ්‍ය තමාගෙන් පළාගිය අන්දම මින් ව්‍යංග්‍යාර්ථවත් කරයි.

බත් දෙකටක් උපයන්නට අටු කොටු පුරවා දවසෙම - බොහෝ වෙහෙස වී ඉතා අඩු මුදලක් උපයන බව මින් ව්‍යංග්‍යාර්ථවත් කරයි.

IV. ඔබ වෙනුවෙන් ඉදෙන බතේ - සිනා හඬට කන් දීගෙන
පිඹ මොළවන විට ළිප ගිනි - දෙව් බොජුනක රස මැවෙන්න

තම පවුල් සංස්ථාව රැක ගැනීමට වෙහෙස වී ආහාර පිසිමින් මහත් උත්සාහයක් දරණ බව.

නැවතත් එන බව නොකියා - හිරු අවරින් නැව් නැඟි පසු
තනිව හඬන ලොවත් සමග - රැයට මුහුණ ලා ඉඳගෙන
ඔබ එන තුරු මග බලමින් - දිව් ගණනක් ගෙවනා විට

තම පවුල් සංස්ථාව රැක ගැනීමට රෑ බෝ වී ස්වාමියා එන තුරු මඟ බලමින් දින ගණන් නිදි වැරීම.

අතීතයක් ගැන සිතමින් - මගේ දෑස දෙස නොබලා
අනාගතය දෙස යොමු වූ - දුවගෙ දෑස දෙස බලන්න.

තමා ගැනවත් නොසිතා තම දියණියගේ අනාගතය ගැන සිතමින් දුක් කම්කටොළු විඳ දරා ගැනීම.

V. දෙව් බොජුන් - දිව්‍ය භෝජන
දියඹ - ගැඹුරු සාගරය
උවම් - උපමා
නිල් ඉඳුවර - නිල් මානෙල්
දිව් ගණනක් - දින ගණනාවක්

2.

I. මානය (අහංකාරය).
II. උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය
III. අවුකන බුදුරුව පිළිබඳව
IV. ශෛලමය
V. මංමුළා වී සිටීම.

3.

| නාම විශේෂණ පද | ක්‍රියා විශේෂණ පද |
|---|---|
| රාත්‍රී අඳුර | වේගයෙන් ස්පන්දනය |
| අඹ යාළුවා | නිතර නිතර දැක |
| සියලුම යක්ෂයන් | බියෙන් ක්ලාන්ත |
| නුග ගසේ | |
| මහ පාරේ | |
| ලාම්පු කණුවේ | |
| දැඩි නිහඬතාවය | |
| බොහෝ ශබ්ද | |
| බට්ටාගේ නාදය | |
| රාත්‍රී කෘමීන්ගේ නාදය | |



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

## ස්තූතියි !

## හසිත හෙට්ටිආරච්චි

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3in1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ